සියලුම හිමිකම් ඇවිරිණි / All Right Reserved

# විද්‍යාරත්න විද්‍යායතන පිරිවෙන - හොරණ

## පළමු වාර පරීක්ෂණය - 2022

## 1st Term Test 2022 - August

| 10 ශ්‍රේණිය | කෘෂි හා ආහාර තාක්ෂණය I | කාලය පැ. 1 යි. |
|---|---|---|

### I කොටස

■ සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

01. ශ්‍රී ලංකාවේ ඉදිකළ ප්‍රථම වැව හා එය ඉදිකළ රජු වන්නේ,
1. මින්නේරිය - මහසෙන් රජු
2. පරාක්‍රම සමුද්‍රය - මහා පරාක්‍රමබාහු රජු
3. අභය වැව - වසභ රජු
4. කලා වැව - ධාතුසේන රජු

02. පෙර කල ශ්‍රී ලංකාවේ ස්වයංපෝෂිත බව ළඟා කර ගැනිමට දායකත්වයක් ලබා නොදුන්නේ යැයි කිව හැක්කේ,
1. රාජ්‍ය අනුග්‍රහය
2. වාරි තාක්ෂණය
3. රාජ්‍ය ත්‍රස්තවාදය
4. ගොවිතැන හා බැඳුනු සංස්කෘතිය

03. වැවක සළපනාව මගින් ඉටුවන කාර්යයක් වන්නේ,
1. වැවේ පීඩනය වැලැක්වීම
2. වැවේ වැඩි ජලය පිට කිරීම
3. වැව් බැම්ම ආරක්ෂා වීම
4. කුඹුරුවලට ජලය මුදා හරින ස්ථානය

04. බීජ ප්‍රතිකාර කිරීමේදී සතකම බීජාවරණය ඉවත් කරනු ලබන බීජ වර්ගය වන්නේ,
1. බෝංචි
2. අඹ
3. බීට්රූට්
4. නොකෝල්

05. ශ්‍රී ලංකාවේ ප්‍රථම බහු කාර්ය යෝජනා ක්‍රමය වන්නේ,
1. උඩවලව යෝජනා ක්‍රමය
2. නිල්වලා යෝජනා ක්‍රමය
3. ගල්ඔය යෝජනා ක්‍රමය
4. ලුණුගම්වෙහෙර යෝජනා ක්‍රමය

06. හරිත විප්ලවය සමඟ කෘෂිකර්මාන්තයේ සිදු වූ වෙනස්කමක් නොවන්නේ,
1. දෙමුහුම් බීජ හඳුන්වා දීම
2. ගොවිපළ යාන්ත්‍රණය වැඩිවීම
3. එක් කන්නයකට සීමා වීම
4. කෘෂි රසායන භාවිතය වැඩිවීම

07. අවශ්‍ය අවස්ථාවකදී අවශ්‍ය ප්‍රමාණ වලින් නියමිත ගුණත්වයෙන් යුක්තව අවශ්‍ය ආහාර වර්ගයක් ලබා ගැනීමට ඇති හැකියාව,
1. ආහාර සුරක්ෂිතතාව
2. ආහාර සංරක්ෂණය
3. ආහාර මිල ඉහළ යාම
4. ආහාර දාමයකි.

08. යම් ප්‍රදේශයක කෙටි කාලයක් තුළ වායුගෝලයේ පවතින ස්වභාවය හඳුන්වන්නේ,
1. කාලගුණය
2. උෂ්ණත්වය
3. දේශගුණය
4. වර්ෂාපතනය

09. සුළඟේ වේගය මැනීමට භාවිත කරන උපකරණය වන්නේ,

1. අනිල මානය යි 2. පීඩන මානය යි. 3. සුළං දිශා දර්ශකය යි. 4. වර්ෂාමනය යි.

10. දල් ගෘහ තුළ බහුලව වගාකරන බෝගයකි,

1. ඕකිඩ් 2. මිරිස් 3. පිපිඤ්ඤා 4. ස්ට්‍රොබෙරි

11. නිර්පාංශු වගාවේදී යොදා ගන්නා සිරස්මළු පිරවීම සඳහා වගා මාධ්‍ය ලෙස යොදා ගන්නේ,

1. ජීවානුහරිත කොම්පෝස්ට් 2. ජීවානුහරිත කොහු කෙඳිය
3. ජීවානුහරිත ගල් කුඩු 4. ජීවානුහරිත රළු වැලි

12. තෙත් හා වියළ බල්බ උෂ්ණත්වමානය භාවිත කර මනිනු ලබන්නේ,

1. උෂ්ණත්වය 2. සාපේක්ෂ ආර්ද්‍රතාවය
3. සුළඟේ වියළි බව 4. සුළඟේ වේගය

13. ශ්‍රී ලංකාවට වර්ෂාව ලැබෙන ප්‍රධාන ක්‍රමයක් වන්නේ,

1. මෝසම් වැසි 2. වාසුලි වැසි 3. අකල් වැසි 4. සංවහන වැසි

14. නිරිතදිග මෝසම් වර්ෂාවෙන් ශ්‍රී ලංකාවට වර්ෂාව ලැබෙන්නේ,

1. මාර්තු - අප්‍රේල් 2. මැයි - සැප්තැම්බර්
3. ඔක්තෝම්බර් - නොවැම්බර් 4. දෙසැම්බර් - පෙබරවාරි

15. යම් ප්‍රදේශයක උෂ්ණත්වය වෙනස්වීමට බලපාන ප්‍රධාන සාධකයක් වන්නේ,

1. උච්චත්වය 2. සමකයේ සිට ඇති දුර
3. වගාබිම් ප්‍රමාණය 4. වන ගහනය

16. වාර්ෂික වර්ෂාපතනය 2500 mm හෝ ඊට වැඩි වර්ෂාපතනයක් ලැබෙන කලාපය වන්නේ,

1. තෙත් කලාපය 2. අතරමැදි කලාපය
3. වියලි කලාපය 4. ශුෂ්ක කලාපය

17. ශ්‍රී ලංකාව දේශගුණික විෂමතා අනුව බෙදා ඇති කෘෂි කාර්මික කලාප සංඛ්‍යාව

1. 46 කි. 2. 20 කි. 3. 15 කි. 4. 11 කි.

18. නිරිත දිග දිශාවෙන් සුළං හමා එන විට සුළං දිශා දර්ශකයේ ඊ හිස යොමුව ඇති දිශාව වන්නේ,

1. නිරිත දිශාව 2. ගිණිකොණ දිශාව 3. ඊසාන දිශාව 4. වයඹ දිශාව

19. ගිණිකඳු පිපිරීම් වලින් පිටතට පැමිණෙන මැග්මා සිසිල්වීමෙන් පසු ඝණීභවනය වී සෑදෙන පාෂානය,

1. ආග්නේය පාෂාණ 2. විපරීත පාෂාණ 3. අවසාධිත පාෂාණ 4. ආසාධිත පාෂාණ

20. භෞතික ජීර්ණයට බලපාන සාධකයක් නොවන්නේ,

1. වර්ෂා ජලය 2. ජලය මිදීම 3. ගලා යන ජලය 4. උෂ්ණත්වය වෙනස් වීම

21. 2 mm දැලකින් හැලූ විට දැලේ ඉතිරි වන පාංශු ඛනිජය,

1. මැටි 2. රළුවැලි 3. බොරළු 4. සියුම් වැලි

22. ශාකවලට අවශෝෂණය කර ගත හැකි පාංශු ජල කාණ්ඩය,
   1. ගුරුත්වාකර්ෂණ ජලය
   2. ජලාකර්ෂණ ජලය
   3. කේෂාකර්ෂණ ජලය
   4. පාංශු ජලය

23. බීජයකට ප්‍රරෝහනය විමට අවශ්‍ය සාධක තිබියදීත් බීජයක් ප්‍රරෝහණය නොවන්නේ,
   1. බීජ බොල්වීම.
   2. බීජ අක්‍රීයත්වය නිසා ය.
   3. බීජ කෘමීන් හානි කිරීම
   4. බීජවල යාන්ත්‍රික හානි

24. පසක ආම්ලිකතාව උදාසීන කිරීමට යොදාගත හැකි ද්‍රව්‍යයකි.,
   1. ලුණු එකතු කිරීම
   2. හුණු යෙදීම
   3. කොම්පෝස්ට් එකතු කිරීම
   4. වැලි එකතු කිරීම

25. උදාසීන පසක pH අගය,
   1. pH 2
   2. pH 7
   3. pH 14
   4. pH 10

26. පාංශු හායනයට හේතුවක් නොවන්නේ,
   1. පසෙහි තද බව
   2. පස ක්ෂාරීය වීම
   3. පස ආම්ලික වීම
   4. පස මතුවීම

27. අනුරාධපුර, පොළොන්නරුව, වව්නියා සහ මොනරාගල ප්‍රදේශවල පැතිරී ඇති සාරවත් පස් කාණ්ඩය,
   1. රතු කහ පොඩ්සොලික් පස
   2. ලැටසොල් පස
   3. දියළු පස
   4. රතු දුඹුරු පස

28. ආලෝකය පවතින කාල සීමා මැනීමට භාවිත කරන උපකරණය වන්නේ,
   1. සූර්ය විකිරණමානය
   2. සුළං දිශා දර්ශකය
   3. අනිල මානය
   4. සූර්ය දීප්තමානය

29. වර්ෂා මානයක් ඇටවීමේදී වර්ෂාමානය පුනීල කට පොළොව මට්ටමේ සිට ඇටවිය යුතු උස,
   1. 15 cm
   2. 25 cm
   3. 20 cm
   4. 30 cm

30. වැඩිදියුණු කළ බෝග ප්‍රභේද සමග කෘතිම පොහොර, කෘෂි රසායනික ද්‍රව්‍ය නව යන්ත්‍රෝපකරණ යනාදිය යොදා ගැනීමෙන් අති විශාල ලෙස කාෂිකාර්මික ඵලදායිතාව වැඩි කර ගැනීම
   1. යාන්ත්‍රීකරණය යි.
   2. රුසියන් විප්ලවය යි.
   3. ස්වයංපෝෂිත රටාව යි.
   4. හරිත විප්ලවය යි.

31. ''අහසින් වැටෙන එක් දිය බිඳක් හෝ මිනිසාගේ ප්‍රයෝජනයට නොගෙන මහ මුහුදට ගලා යාමට ඉඩ නොතැබිය යුතුය'' මෙය කාගේ ප්‍රකාශයක් ද?
   1. මහසෙන් රජුගේ
   2. වසභ රජුගේ
   3. ධාතුසේන රජුගේ
   4. මහා පරාක්‍රමබාහු රජුගේ

32. ගොවි යුගයේ මිනිසා ජලාශ ආශ්‍රිතව වාසස්ථාන තනා ගැනීමට ප්‍රධාන හේතුව,
   1. ආහාර සොයා ගැනීමට පහසුව
   2. නෑමට ඇති කැමැත්ත
   3. මසුන් අල්ලා ගැනීමට
   4. කෘෂි කර්මාන්තයටජලය ලබා ගැනීමට

33. පාංශු ජීවීන් බෝග වගාවට වැදගත් වන්නේ,

1. රෝග බෝ කිරීමට
2. පසේ නයිට්‍රජන් ඉවත් කිරීමට
3. ශාක පළිබෝධකයෙකු ලෙස
4. නයිට්‍රජන් තිර කිරීමට

34. පස් ස්වල්පයක් ගෙන ජලයෙන් තෙත් කර රෝල් කර මුදුවක් ලෙස සැකසිය හැකි නම් එම වයනය ගැන කිව හැක්කේ,

1. වැලි පසක් බව
2. මැටි ලොම් පසක් බව
3. වැලි ලෝම පසක් බව
4. මැටි පසක් බව

35. පාංශු වර්ණය කෙරෙහි බල නොපාන්නේ

1. අඩංගු ඛනිජ වර්ගය
2. පාංශු කාබනික ද්‍රව්‍ය ප්‍රමාණය
3. පාංශු ජලවහන තත්ත්වය
4. දිය වී ඇති ලවණ තත්ත්වය

36. pH 4.5 - 6.5 අතර පසක් ගැන කිවහැක්කේ,

1. උදාසින පසකි.
2. ක්ෂාරීය පසකි.
3. ආම්ලික පසකි.
4. ප්‍රබල ආම්ලික පසකි.

37. පාංශු දේහයෙන් වෙන්වීම, වෙනත් ස්ථානයක් වෙත ගසා ගෙන යාම හා තැන්පත් වීම යන ක්‍රියාවලිය,

1. පාංශු හායනය යි.
2. පාංශු ඛාදනය යි.
3. පාංශු තෙතමනයයි.
4. පාංශු ක්ෂාරීයතාවයයි.

38. පාංශු ඛාදනයේ අහිතකර ප්‍රතිඵලයකි,

1. පාංශු ස්ථරයේ ඝනකම වැඩිවීම
2. පාංශු ඌණතාව නැති වී යාම
3. මූල මණ්ඩලය සේදී ශාක ඇද වැටීම
4. කෘෂිකාර්මික ඉඩම්වල වටිනාකම වැඩිවීම

39. විසිරී ඛාදනය යනු,

1. ජල අංශු විසිරී යාමයි.
2. පස් අංශු විසිරී යාමයි.
3. ජල අංශු කැඩී යාමයි.
4. පස් අංශු එකතු වීමයි.

40. පස වසුන් කිරීම යනුවෙන් හඳුන්වන්නේ,

1. හරකුන් බැඳීමයි.
2. වර්ෂාවට නිරාවරණය කිරීමයි.
3. ආවරණ යෙදීමයි.
4. වැස්ස ලෙස ජලය යෙදීමයි.

සියලුම හිමිකම් ඇවිරිණි / All Right Reserved

# විද්‍යාරත්න විද්‍යායතන පිරිවෙන - හොරණ

## පළමු වාර පරීක්ෂණය - 2022

## 1st Term Test 2022 - August

10 ශ්‍රේණිය | කෘෂි හා ආහාර තාක්ෂණය II

### II කොටස

➢ පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

01. ශ්‍රී ලංකාව අතීතයේ සිට කෘෂිකාර්මික රටකි.
    i. ශ්‍රී ලංකාවේ ඉදිකළ ප්‍රථම වැව නම් කරන්න.
    ii. එය ඉදිකළ රජතුමා නම් කරන්න.
    iii. ශ්‍රී ලංකාවේ විශාලතම බහුකාර්ය යෝජනා ක්‍රමය නම් කරන්න.
    iv. ප්‍රථම බහු කාර්ය යෝජනා ක්‍රමයේ නිර්මාතෘ නම් කරන්න.
    v. වර්ෂාව මනින උපකරණය හා ඒකකය ලියන්න.
    vi. ශ්‍රී ලංකාවේ වර්ථමාන අපනයන බෝග දෙකක් නම් කරන්න.
    vii. උෂ්ණත්වය මනින ඒකක දෙකක් ලියන්න.
    viii. සුළඟේ වේගය සහ දිශාව මනින උපකරණ මොනවාද?
    ix. බෝග වගාවට සුළඟින් වන අයහපත් බලපෑම් දෙකක් ලියන්න.
    x. පාෂාණ ජීර්ණයට බලපාන සාධක දෙකක් ලියන්න.

02. i. පාංශු පැතිකඩක් යනු කුමක්ද?
    ii. දර්ශීය පාංශු පැතිකඩක් ඇඳ නම් කරන්න.
    iii. පාංශු ගැඹුර ලෙස හැඳින්වෙන කලාප නම් කරන්න.

03. i. පාංශු කාබනික ද්‍රව්‍ය යනු මොනවාද?
    ii. පාංශු කාබනික ද්‍රව්‍යවල වැදගත්කම් පහක් ලියන්න.
    iii. පාංශු වාතය බෝගවගාවට වැදගත්වන ආකාර 4 ක් ලියන්න.

04. i. පසේ ජලය පවතින ප්‍රධාන ආකාර තුන නම් කරන්න.
    ii. ශාකවලට ලබාගත හැකි ජල කාණ්ඩය නම් කරන්න.
    iii. පාංශු ජලය බෝග වගාවට වැදගත්වන ආකාර පහක් ලියන්න.

05. i. වැවක රූපසටහනක් ඇඳ ප්‍රධාන කොටස් නම් කරන්න.
    ii. එම කොටස් වලින් ඉටුවන කාර්යය වෙන වෙනම ලියන්න.
    iii. බහු කාර්ය යෝජනා ක්‍රමයකින් ඉටුකිරීමට බලාපොරොත්තු වන කාර්යයන් පහක් ලියන්න.

06. i. පාංශු ව්‍යුහය යනු කුමක්ද?
    ii. පාංශු ව්‍යුහ ආකාර ඇඳ නම් කරන්න.
    iii. පාංශු ව්‍යුහය ආරක්ෂා කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග 3 ක් ලියන්න.